'ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2260/57 - 2021 දෙසැම්බර් මස 29 වැනි බදාදා - 2021.12.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත (262 අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ආ(2) වගන්තිය යටතේ පූනකරි ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම

2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 169 වන වගන්තිය ප්‍රකාරව සභාපති ධුරයෙන් ඉල්ලා අස්වුවා සේ සළකනු ලැබීම හේතුකොට ගෙන පූනකරි ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 ආ(2) වගන්තිය යටතේ තනතුරු දැරූ සභාපති වන අරුණාසලම් අයියම්පිල්ලෙ අයත්වන්නා වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම පූනකරි ප්‍රාදේශීය සභාවේ සභාපති පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා සිවකුමරන් ශ්‍රීරන්ජන් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

පූනකරි ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, වින්සන් ගුණාලන් වින්සන් ඥානදයාලන් වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66ආ(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් සිවකුමරන් ශ්‍රීරන්ජන්, පූනකරි ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

ඩබ්. ජී. ඩබ්. ඥානදයාලන්,
තේරීම්භාර නිලධාරි,
පූනකරි ප්‍රාදේශීය සභාව.

2021 දෙසැම්බර් මස 29 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කිලිනොච්චි.

EOG 12 - 0333

1A - G 35714 — 20 (2021/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*